# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

# Economics

නිපුණතාව 2

:- ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළෙඳපොළ සමතුලිතය විශ්ලේෂණය කරයි.

---

## වෙළඳපොළ සමතුලිතය

**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**


**සම්පත් දායකත්වය :R H M S කුමුදුනී රාජකරුණා**
**ර විද්‍යාලෝක ම. ම. වි**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# අන්තර්ගතය


- වෙළඳපොළ ඉල්ලුම
- වෙළඳපොළ සැපයුම
- වෙළඳපොළ සමතුලිතය
- ඉල්ලුම් නම්‍යතාවය
- සැපයුම් නම්‍යතාවය

# ඉල්ලුම

නිශ්චිත කාලයක් තුළ ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩය සඳහා වූ විවිධ මිල ගණන් යටතේ මිල දී ගැනීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණ ඉල්ලුම ලෙස හැඳින්වේ.

ඉල්ලුමක් ඇති වීමට

- වුවමනාවක්
- ක්‍රය ශක්තියක්
- මිලදී ගැනීමේ සැලැස්මක් පැවතිය යුතුය

<u>වුවමනා සහ ඉල්ලුම</u>

වුවමනා යනුවෙන් හැඳින්වෙන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනය සඳහා පුද්ගලයන් තුළ ඇති අසීමිත ආශාවයි.නමුත් අප හැමදෙනාම මුහුණ දෙන හිගකම නමැති ගැටළුව නිසා වුවමනා බොහෝමයක් සපුරා ගැනීමට නොහැකිය.

ඉල්ලුම යන්නෙන් පිළිබිඹු කරන්නේ එම අසීමිත වුවමනා අතරින් සපුරා ගැනීමට හැකියාව ඇති එනම් සපුරා ගැනීමට තීරණය කරන ලද වුවමනා පමණි. එනම් වුවමනා යනු ඉල්ලුමක් ඇති වීමට බලපාන එක් සාධකයක් පමණි.

**වුවමනාවක් ,ක්‍රය ශක්තියක් ,මිලදී ගැනීමේ සැලැස්මක් , යන කරුණු තුනෙන් සමන්විත වන ඉල්ලුම සඵල ඉල්ලුමක් ලෙස හඳුන්වයි**

ඉල්ලුම

පෞද්ගලික ඉල්ලුම

නිශ්චිත කාලයක් තුළ දී වෙළෙඳපොළේ සිටින එක් ගැනුම්කරුවකු විසින් සලකා බලන භාණ්ඩයට පවතින විකල්ප මිල යටතේ මිල දී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණ පෞද්ගලික ඉල්ලුම ලෙස හැඳින්වේ.

වෙළෙඳපොළ ඉල්ලුම

නිශ්චිත කාලයක් තුළ දී වෙළෙඳපොළේ සිටින සියලු ම ගැනුම්කරුවන් විසින්, සලකා බලන භාණ්ඩය සඳහා පවතින විකල්ප මිල ගණන් යටතේ මිල දී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණවල එකතුව වෙළෙඳපොළ ඉල්ලුම ලෙස හැඳින්වේ.

## පෞද්ගලික ඉල්ලුම තීරණය කරන සාධක

- සලකා බලන භාණ්ඩයේ මිල P
- සාම්බන්ධික භාණ්ඩවල මිල Pn
- පාරිභෝගිකයාගේ ආදායම Y
- පාරිභෝගිකයාගේ රුචිය T
- අනාගතය පිළිබඳ අපේක්ෂාවන් Ex
- අනෙකුත් සාධක O

## පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිතය

කිසියම් භාණ්ඩයක් සඳහා පෞද්ගලික ඉල්ලුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය සමීකරණයක් ලෙස ඉදිරිපත් කළ විට එය පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිතය ලෙස හැඳින්වේ. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

$$Qd_A = f(P, Pn, Y, T, Ex, O)$$

## වෙළෙඳපොල ඉල්ලුම තීරණය කරන සාධක

- සලකා බලන භාණ්ඩයේ මිල P
- සාම්බන්ධික භාණ්ඩවල මිල Pn
- පාරිභෝගිකයාගේ ආදායම Y
- පාරිභෝගිකයාගේ රුචිය T
- අනාගතය පිළිබඳ අපේක්ෂාව Ex
- ගැනුම්කරුවන් සංඛ්‍යාව හා එහි සංයුතිය N
- අනෙකුත් සාධක O

## වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය

කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය සමීකරණයක් ලෙස ඉදිරිපත් කළ විට එය වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය ලෙස හැඳින්වෙන අතර එය පහත පරිදි පෙන්විය හැකි ය.

$$Qd = f(P, Pn, Y, T, Ex, N, O)$$

**පෞද්ගලික ඉල්ලුම මත වෙළෙඳපොළ ඉල්ලුම අතර තීරණය වේ**

# ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය

## ඉල්ලුම් න්‍යාය

ඉල්ලුම් තීරණය වීමට බලපාන ඕනෑම සාධකයක් වෙනස් වීමට අනුකූල ව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වෙනස් වන ආකාරය විග්‍රහ කොට දැක්වීම ඉල්ලුම් න්‍යායය ලෙස හැඳින්වේ.

## ඉල්ලුම් නීතිය

දෙන ලද නිශ්චිත අවස්ථාවක දී, ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල හා එහි ඉල්ලුම් ප්‍රමාණය අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාව ඉල්ලුම් නීතිය ලෙස හැඳින්වේ.

ඉල්ලුම් නීතිය ඉදිරිපත් කිරීමේ දී එය පහත සඳහන් උපකල්පන මත පිහිටා ඇත.


- නිශ්චිත අවස්ථාවක මිල හා ඉල්ලුම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීම
- මිල හැර ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව පැවතීම
- සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම සැලකිල්ලට ගැනීම
- තාර්කික ගැනුම්කරුවන්ගේ හැසිරීම් සැලකිල්ලට ගැනීම

## ඉල්ලුම් නීතිය ඉදිරිපත් කළ හැකි විකල්ප ක්‍රම

### ඉල්ලුම් ලේඛනය

| මිල | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|
| 0 | 400 |
| 10 | 300 |
| 20 | 200 |
| 30 | 100 |
| 40 | 0 |

### ඉල්ලුම් වක්‍රය




### ඉල්ලුම් සමීකරණය

$$Qd = a - bp$$


## ඉල්ලුම් ලේඛනය

නිශ්චිත අවස්ථාවක ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයට පැවතිය හැකි විකල්ප මිල ගණන් යටතේ ගැනුම්කරුවන් මිල දී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් දක්වන ලේඛනය ඉල්ලුම් ලේඛනය ලෙස හඳුන්වයි.

| සලකා බලන භාණ්ඩයේ මිල (රු) | අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය ( ඒකක) |
|---|---|
| 0 | 300 |
| 10 | 250 |
| 20 | 200 |
| 30 | 150 |
| 40 | 100 |
| 50 | 50 |
| 60 | 0 |

## ඉල්ලුම් වක්‍රය

නිශ්චිත අවස්ථාවක, ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ විකල්ප මිල ගණන් යටතේ ඉල්ලුම ප්‍රමාණයන් දක්වන ලක්ෂ්‍යයන් සම්බන්ධ කොට අඳිනු ලබන රේඛාව ඉල්ලුම් වක්‍රය ලෙස හඳුන්වයි.



<u>ඉල්ලුම් සමීකරණය</u>

නිශ්චිත අවස්ථාවක ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල ගණන් හා ඉල්ලුම් ප්‍රමාණ අතර ප්‍රතිලෝම සම්බන්ධතාව සමීකරණයක් මගින්සාරාංශ කොට දැක්වීම ඉල්ලුම් සමීකරණය ලෙස සලකයි.

$$Qd = a - bP$$

Qd → ඉල්ලුම් ප්‍රමාණය ( පරායත්ත විචල්‍ය )
a → මිල ශුන්‍ය වන විට ඉල්ලුම් ප්‍රමාණය
b → මිල සංගුණකය

$$b = \frac{\Delta Qd}{\Delta P}$$

$\Delta Qd$ → ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස

$\Delta P$ → මිලේ වෙනස

p → සලකා බලන භාණ්ඩයේ මිල ( ස්වායත්ත විචල්‍ය )

ඉහත ඉල්ලුම් ලේඛනයට අදාළ ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න

$Qd = a - bp$

<u>Qd = 300 – 5 p</u>

a = 300

$$b = \frac{\Delta Qd}{\Delta P}$$

$$b = \frac{-50}{10}$$

b = -5

Activity

| මිල | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|
| 0 | 2000 |
| 500 | 1000 |

1, 1 ඉහත ඉල්ලුම් ලේඛනයට අදාළ ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

1, 2 ඉහත ඉල්ලුම් ලේඛනයට අදාළ ඉල්ලුම් වක්‍රය අදින්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

2 $Qd = 500 - 20p$ නම්

2 .1 ඉල්ලුම් වක්‍රය අදින්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

2. 2 ඉල්ලුම් ලේඛනය ගොඩනගන්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

මිල උක්තකල ඉල්ලුම් සමීකරණය හෙවත් මිල සමීකරණය ගොඩනගමු

$Qd = 500 – 20 p$ නම්

$20\ p = 500 – Qd$

$P = \frac{500 – Qd}{20}$

$\underline{P = 25 – 0.05\ Qd}$

### ඉල්ලුම් නීතියට බලපාන හේතු

සලකා බලන භාණ්ඩයේ මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධය ඇති වීමට හේතු විවිධ ප්‍රවේශ ඔස්සේ ඉදිරිපත් වී ඇති නමුදු මෙහි දී සලකා බලන්නේ මිල ප්‍රතිවිපාකය පිළිබඳ ව පමණි.

මිල ප්‍රතිවිපාකය සමන්විත වන්නේ උප ප්‍රතිවිපාක දෙකකිනි. එනම්

1 මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය


ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි හෝ වීම හේතු කොටගෙන එහි සාපේක්ෂ මිල අඩු හෝ වැඩි හෝ වීම නිසා සලකා බලන භාණ්ඩය සඳහා වූ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම ආදේශන ප්‍රතිවිපාකය ලෙස පහැදින්වේ.

2 මිල වෙනස් වීමක ආදායම් ප්‍රතිවිපාකය

ගැණුම්කරුවන්ගේ මුදල් ආදායම ඇතුළු අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි හෝ වීම හේතු කොටගෙන මූර්ත ආදායමේ ඇති වන වෙනස් වීම් මත සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වීම ආදායම් ප්‍රතිවිපාකය ලෙස සලකයි.

## ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා

ඉල්ලුම් නීතියට පටහැනිව භාණ්ඩ හැසිරෙන අවස්ථා 03 කි. මෙවැනි අවස්ථාවල ඉල්ලුම් වක්‍රය ඉහළට බෑවුම් වේ.




1 ගිෆන් භාණ්ඩ

- ගිෆන් භාණ්ඩ වල ප්‍රධානම ලක්ෂණය වන්නේ මිල වැඩි වන විට ඉල්ලුම් ප්‍රමාණයද වැඩි වීමයි. එනම් මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධයයි.

මෙවැනි තත්වයක් ඇතිවීම සඳහා බලපාන ගිෆන් භාණ්ඩ වල ඇති තවත් ලක්ෂණ 02 කි.

1 මෙවැනි භාණ්ඩ වල ආදායම හා ඉල්ලුම අතර ඇත්තේ ඍණ සම්බන්ධයකි.එබැවින් ගිෆන් භාණ්ඩ හාල භාණ්ඩ ගණයට වැටේ.

2 දෙවනි ලක්ෂණය නම් අඩු ආදායම් ලබන්නන්ගේ ආදායමෙන් වැඩි කොටසක් ඔවුන් වැය කරන්නේ මෙවැනි භාණ්ඩ පරිභෝජනය සඳහාය.

එබැවින් ගිෆන් භාණ්ඩයක මිල වැඩි වූ විට හටගන්නා ඍණ ආදායම් ප්‍රතිවිපාකය ඉතා ප්‍රබල වන අතර ආදේශන ප්‍රතිවිපාකය සාපේක්ෂ වශයෙන් දුර්වල ස්භාවයක් ගනී. මේනිසාම මිල වැඩි වන විට ඉල්ලුම් ප්‍රමාණයද වැඩි වේ

2 ප්‍රදර්ශනාත්මක භාණ්ඩ හෙවත් මිල අධික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම

මෙවැනි භාණ්ඩ වලින් තම තත්වය ප්‍රදර්ශනය කිරීමට පුද්ගලයන් පෙළඹේ.එබැවින් මිල අධික භාණ්ඩ වැඩිපුර ඉල්ලුම් කරයි

උදා : රත්‍රං
මැණික්
මිල අධික වාහන

3 මිලෙන් ගුණත්වය මනින භාණ්ඩ

මිලෙන් වැඩි භාණ්ඩ ගුණත්වයෙන් ඉහළ යැයි විශ්වාස කරන අවස්ථාවලදීද මිල වැඩි භාණ්ඩ වැඩිපුර ඉල්ලුම් කරයි.

උදා : ඖෂධ


# ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම හා ඉල්ලුම වෙනස් වීම

ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි වීමකට ප්‍රතිචාරි ව එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි හෝ අඩු වීම ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම ලෙස හඳුන්වයි.මෙය ඉල්ලුම් වක්‍රය දිගේ ලක්ෂ ඉහළට හා පහළට ගමන්කරවීම මගින් දක්විය හැකිය

<u>ඉල්ලුම් ප්‍රමාණය අඩු වීම</u>


අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වුව හොත් එහි ඉල්ලුම් ප්‍රමාණය අඩු වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය ඉහළට ගමන් කරයි.




අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල P1සිට P2 දක්වා වැඩිවීමේ දී ඉල්ලුම් ප්‍රමාණය Qd 2 සිට Qd1 දක්වා අඩුවේ මෙය ඉල්ලුම් ප්‍රමාණය අඩු වීම හෙවත් ඉල්ලුම් සංකෝචනය ලෙස හඳුන්වයි. එය ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට ගමන්කිරීම මගින් ( A – B ) දක්විය හැකිය

<u>ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීම</u>

අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වුවහොත් එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි වන අතර එහි බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය දිගේ පහළට ගමන් කරයි.




අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල P2සිට P1 දක්වා අඩුවීමේ දී ඉල්ලුම් ප්‍රමාණය Qd 1 සිට Qd2 දක්වා වැඩිවේ මෙය ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීම හෙවත් ඉල්ලුම් ප්‍රසාරණය ලෙස හඳුන්වයි. එය ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන්කිරීම මගින් ( A – B ) දැක්විය හැකිය


ඉල්ලුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වීමක් ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කිරීම මගින් දැක්විය හැකිය

ඉල්ලුම වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබියදී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම කරුණ කොටගෙන පැවති මිල යටතේ ම ඉල්ලුම ඉහළ යාම හෝ පහළ යාම හෝ ඉල්ලුම වෙනස් වීම ලෙස හඳුන්වයි.

<u>ඉල්ලුම වැඩි වීම</u>

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබිය දී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම නිසා පැවති මිල යටතේ ම ඉල්ලුම ඉහළ ගොස් ඉල්ලුම් වක්‍රය දකුණු පසට විතැන් වීම ඉල්ලුම වැඩි වීම ලෙස හඳුන්වයි.





මෙහිදී මිල ස්ථාවරව පවතින අතර ඉල්ලුම පමණක් වෙනස් වේ

ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට පහත සඳහන් හේතු බලපායි.

- ආදේශන භාණ්ඩවල මිල වැඩි වීම
- අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම
- පාරිභෝගික ආදායම වැඩි වීම
- පාරිභෝගික රුචිය වැඩි වීම
- අනාගතයේ දී මිල වැඩි වෙතැයි අපේක්ෂා කිරීම
- ගැනුම්කරුවන් සංඛ්‍යාව වැඩි වීම

- ඉල්ලුම අඩු වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබිය දී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධකයක් වෙනස් වීම නිසා පැවැති මිල යටතේ ම ඉල්ලුම පහළ ගොස් ඉල්ලුම් වක්‍රය වම් පසට විතැන් වීම ඉල්ලුම අඩු වීම ලෙස හඳුන්වයි.




ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට පහත සඳහන් හේතු බලපායි.

- ආදේශන භාණ්ඩවල මිල අඩු වීම
- අනුපූරක භාණ්ඩවල මිල වැඩි වීම
- පාරිභෝගික ආදායම අඩු වීම
- පාරිභෝගික රුචිය අඩු වීම
- අනාගතයේ දී මිල අඩු වෙතැයි අපේක්ෂා කිරීම
- ගැනුම්කරුවන් සංඛ්‍යාව අඩු වීම



Activity

1 ජංගම දුරකතනයක ඉල්ලුම වැඩිවීමට බලපාන සාධක මොනවාද?

# සැපයුම

ආර්ථික විද්‍යාවේ දී සැපයුම යනුවෙන් අදහස් කරන්නේ යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළේ පැවතිය හැකි විකල්ප මිලයන් හී දී නිෂ්පාදකයන් සින් සැපයීමට කැමති, සැපයීමට හැකියාව ඇති සහ සපයනු ලබන විවිධ ප්‍රමාණ ය..

යම් භාණ්ංයක් සැපයීමට නම්

- එම භාණ්ඩය නිෂ්පාදනයට අවශ්‍ය සම්පත් හා තාක්ෂණය ආයතනය සතු විය යුතුය
- එම භාණ්ඩය නිෂ්පාදනයෙන් ලාභ උපයිය හැකි විය යුතුය
- එම භාණ්ඩය නිෂ්පාදනයට හා අලවියට සැලැස්මක් ආයතනය සතු විය යුතුය

සැපයුම

→ ආයතනයක සැපයුම

→ වෙළෙඳපොළ සැපයුම

## ආයතනයක සැපයුම

සම්පත් භාවිත කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර විකිණීමට ඉදිරිපත් කරන ආර්ථික ඒකකයක් ආයතනයක් නම් වේ.

නිදසුන්:- විකිණීම සඳහා වී වගා කරන ගොවියෙකි.

එවැනි ආයතනයක් නිශ්චිත කාලයක් තුළ විවිධ මිල ගණන් යටතේ සැපයීමට කැමති ප්‍රමාණ ආයතනික සැපයුම වේ.

නිදසුන් :- ඉහත සඳහන් ගොවියා විවිධ මිල ගණන් යටතේ වෙළෙඳපොළට අලෙවි කරන වී කිලෝ ග්‍රෑම් ප්‍රමාණ

<u>ආයතනයක සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක</u>

- සලකා බලන භාණ්ඩයේ මිල (P)
- යෙදවුම් මිල (C)
- තාක්ෂණය (T)
- සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන් (Pn)
- නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)
- රජයේ ප්‍රතිපත්ති (G)
- වෙනත් සාධක (O)

## වෙළෙඳපොළ සැපයුම

යම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කරන සියලු ආයතනයන්හී එකතුව වෙළෙඳපොළ නම් වේ.

නිදසුන් :- විකිණීම සඳහා වී වගා කරන සියලු ම ගොවීන්ගේ එකතුව

එම ආයතන සියල්ල ම නිශ්චිත කාලයක් තුළ අලෙවි කරන ඒකක ප්‍රමාණයන්ගේ එකතුව වෙළෙඳපොළ සැපයුමයි.

- නිදසුන් :- :- සියලු ම වී ගොවීන් විවිධ මිල ගණන් යටතේ අලෙවි කරන වී කිලෝ ග්‍රෑම් ප්‍රමාණය

<u>වෙළෙඳපොළ සැපයුම තීරණය කරන සාධක</u>

- සලකා බලන භාණ්ඩයේ මිල (P)
- යෙදවුම් මිල (C)
- තාක්ෂණය (T)
- සම්බන්ධිත භාණ්ඩ වල මිල ගණන් (Pn)
- නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)
- **වෙළෙඳපොළේ සිටින නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව** (N)
- රජයේ ප්‍රතිපත්ති (G)
- වෙනත් සාධක (O)

ආයතනික සැපයුම

කිසියම් භාණ්ඩයක් සඳහා ආයතනික සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය ආයතනික සැපයුම් ශ්‍රිතය වේ.

$QS_A = f(P, Pn, C, T, Ex, G, O)$

වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය

කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය වෙළෙඳපොළ සැපයුම ශ්‍රිතය වේ.

$QS = f(P, Pn, C, T, Ex, G, N, O)$

# ආයතනික සැපයුම මත වෙළෙඳපොළ සැපයුම තීරණය වේ

## සැපයුම් න්‍යාය හා සැපයුම් නීතිය

### සැපයුම් න්‍යාය

සැපයුම තීරණය කරන ඕනෑම සාධකයක් වෙනස් වීම ට අනුකූල ව සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස් වන ආකාරය විග්‍රහ කොට දැක්වීම සැපයුම් න්‍යායයි.

### සැපයුම් නීතිය


සැපයුම් නීතිය යනු යම් නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාවයි.

සැපයුම් නීතිය ඉදිරිපත් කළ හැකි විකල්ප ක්‍රම

සැපයුම් ලේඛනය

| මිල | සැපයුම් ප්‍රමාණය |
|---|---|
| 0 | 0 |
| 10 | 100 |
| 20 | 200 |
| 30 | 300 |
| 40 | 400 |

සැපයුම් වක්‍රය




සැපයුම් සමීකරණය

$QS = a + bp$


## සැපයුම් ලේඛනය

සැපයුම් ලේඛනය යනු නිශ්චිත අවස්ථාවක දී සැපයුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයට පැවතිය හැකි විවිධ මිල ගණන් යටතේ සැපයීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණයන් දක්වන සංඛ්‍යා සටහන යි. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

| සලකා බලන භාණ්ඩයේ මිල (රු) | අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය ( ඒකක) |
|---|---|
| 0 | 0 |
| 10 | 50 |
| 20 | 100 |
| 30 | 150 |
| 40 | 200 |
| 50 | 250 |
| 60 | 300 |

## සැපයුම් වක්‍රය

දෙන ලද නිශ්චිත අවස්ථාවක දී සැපයුමට බලපාන අනිකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයට පවතින විවිධ වූ මිල ගණන් යටතේ සැපයීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් සම්බන්ධ කොට අඳිනු ලබන රේඛාව සැපයුම් වක්‍රය යි. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.



<u>සැපයුම් සමීකරණය</u>

දෙන ලද නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනිකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාව වීජීය ප්‍රකාශනයක් මගින් දැක්වීම සැපයුම් සමීකරණය යි.

$$QS = a + bp$$

Qs ⟶ සැපයුම් ප්‍රමාණය ( පරායත්ත විචල්‍ය )

a ⟶ සැපයුම් වක්‍රයේ තිරස් අන්තඃඛණ්ඩය ( මිල 0 දී සැපයුම් ප්‍රමාණය)

b ⟶ ( මිල එක් ඒකකයකින් වෙනස් වූ විට සැපයුම් ප්‍රමාණය කොතරම් වෙනස් වනවාද යන්න

$$b = \frac{\Delta QS}{\Delta P}$$

$\Delta QS$ ⟶ සැපයුම් ප්‍රමාණයේ වෙනස

$\Delta P$ ⟶ මිලේ වෙනස

p ⟶ සලකා බලන භාණ්ඩයේ මිල ( ස්වායත්ත විචල්‍ය )

ඉහත ඉල්ලුම් ලේඛනයට අදාළ ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න

$QS = a + bp$

<u>$QS = 5p$</u>

$a = 0$

$$b = \frac{\Delta QS}{\Delta P}$$

$$b = \frac{50}{10}$$

$b = 5$

 Activity

| මිල | සැපයුම් ප්‍රමාණය |
|---|---|
| 0 | 1000 |
| 500 | 5000 |

1, 1 ඉහත සැපයුම් ලේඛනයට අදාළ සැපයුම් සමීකරණය ගොඩනගන්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

1, 2 ඉහත සැපයුම් ලේඛනයට අදාළ සැපයුම් වක්‍රය අඳින්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

2 $Qs = 200 + 20p$ නම්

2 .1 සැපයුම් වක්‍රය අඳින්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

2. 2 සැපයුම් ලේඛනය ගොඩනගන්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

මිල උක්තකල සැපයුම් සමීකරණය

Qs = 200 – 20 p නම්

20 p = 200 – Qs

$$P = \frac{200 - Qs}{20}$$

<u>P = 10 – 0.05 Qs</u>

සැපයුම් නීතියට බලපාන හේතු

- සැපයුම් නීතියට වැඩි වන ආන්තික පිරිවැය නීතිය බලපායි.

කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිෂ්පාදනය කරන විට එහි ආවස්ථික පිරිවැය ද ඉහළ යන බව වැඩි වන ආන්තික පිරිවැය නීතියෙන් කියවේ. නිමැවුම වැඩි වන විට ආන්තික පිරිවැය ද ඉහළ නගින බැවින් සිය නිෂ්පාදනය වැඩි කිරීමට නිෂ්පාදකයන් පෙලඹෙනුයේ වැඩිවන ආන්තික පිරිවැය පියවා ගැනීමට හැකි වන පරිදි භාණ්ඩයේ මිල ඉහළ නගිනවා නම් පමණි. සලකයි.


## සැපයුම් ප්‍රමාණය වෙනස් වීම හා සැපයුම් වෙනස් වීම

### සැපයුම් ප්‍රමාණය වෙනස් වීම

මිල හැර සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණයේ ඇති වන වෙනස සැපයුම් ප්‍රමාණය වෙනස් වීම යි.

### සැපයුම් ප්‍රමාණය අඩු වීම


සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් කරුණු ස්ථාවර ව තිබියදී සලකන භාණ්ඩයේ මිල අඩු වන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය අඩු වේ. එහිදි සැපයුම් වක්‍රය ලක්ෂ්‍යයක සිට එම වක්‍රයේ දිගේ තවත් පහළ ලක්ෂ්‍යය ට ගමන් කරයි.




අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල P2සිට P1දක්වා අඩුවීමේ දී සැපයුම් ප්‍රමාණය Qd 2 සිට Qd1 දක්වා අඩුවේ මෙය සැපයුම් ප්‍රමාණය අඩු වීම හෙවත් සැපයුම් සංකෝචනය ලෙස හඳුන්වයි. එය සැපයුම් වක්‍රය දිගේ පහළට ගමන්කිරීම මගින් ( **B** – A ) දැක්විය හැකිය

## සැපයුම් ප්‍රමාණය වැඩි වීම

සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් කරුණු ස්ථාවර ව තිබියදී සලකන භාණ්ඩයේ මිල වැඩිවන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වැඩි වේ.




අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල P2සිට P1 දක්වා වැඩිවීමේ දී සැපයුම් ප්‍රමාණය Qd 1 සිට Qd2 දක්වා වැඩිවේ මෙය සැපයුම් ප්‍රමාණය වැඩි වීම හෙවත් සැපයුම් ප්‍රසාරණය ලෙස හඳුන්වයි. එය සැපයුම් වක්‍රය දිගේ පහළට ගමන්කිරීම මගින් ( A – B ) දැක්විය හැකිය


**සැපයුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වීමක් සැපයුම් වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කිරීම මගින් දැක්විය හැකිය**

## සැපයුම වෙනස් වීම

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවර ව තිබිය දී සැපයුම තීරණය කරන අනෙකුත් සාධක වෙනස් වීම නිසා සැපයුම අඩු වීම හෝ වැඩි වීම හෝ සැපයුම වෙනස් වීම ලෙස හඳුන්වයි.

## සැපයුම වැඩි වීම

මිල ස්ථාවර ව තිබිය දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක වෙනස් වීම නිසා සැපයුම් රේඛාව දකුණට ගමන් කිරීම ( විතැන් වීම) සැපයුමේ වැඩි වීමකි.





මෙහිදී මිල ස්ථාවරව පවතින අතර සැපයුම පමණක් වෙනස් වේ

සැපයුම් වක්‍රය දකුණට ගමන් කිරීමට බලපාන සාධක

1. සම්බන්ධික භාණ්ඩ මිල අඩු වීම
2. නිෂ්පාදනයට යොදාගන්නා යෙදවුම් මිල අඩු වීම
3. තාක්ෂණික දියුණුව
4. වෙළෙඳසැලේ සිටින සැපයුම්කරුවන් ප්‍රමාණය වැඩි වීම.
5. රජය නිෂ්පාදකයාගෙන් අය කරන බදු කපා හැරීම
6. රජය නිෂ්පාදකයාට සහනාධාර ලබා දීම
7. අනාගතයේ සලකන භාණ්ඩයේ මිල අඩු වෙතැයි නිෂ්පාදකයා අපේක්ෂා කිරීම

- සැපයුම අඩු වීම

මිල ස්ථාවර ව තිබිය දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක වෙනස් වීම නිසා සැපයුම් රේඛාව වමට ගමන් කිරීම ( විතැන් වීම) සැපයුමේ අඩුවීමකි.




සැපයුම් වක්‍රය වමට ගමන් කිරීමට බලපාන සාධක

- සම්බන්ධිත භාණ්ඩ මිල වැඩි වීම
- නිෂ්පාදකයාට යොදාගන්නා යෙදවුම් මිල වැඩි වීම
- තාක්ෂණය යල් පැනීම
- වෙළෙඳපලේ සිටින සැපයුම්කරුවන් ප්‍රමාණය අඩු වීම
- රජය නිෂ්පාදකයාගෙන් අය කරන බදු වැඩි කිරීම
- රජය නිෂ්පාදකයාට ලබාදෙන සහනාධාර කපා හැරීම
- අනාගතයේ සලකන භාණ්ඩයේ මිල වෙතැයි නිෂ්පාදකයා අපේක්ෂා

කිරීම  Activity

1 ජංගම දුරකතනයක සැපයුම වැඩිවීමට බලපාන සාධක මොනවාද?

# වෙළෙඳපොළ සමතුලිතය

- වෙළෙඳපොළ

ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර ගනුදෙනුවක් සිදුවන ඕනෑම ආකාරයක් වෙළඳපළකි

වෙළෙඳපොළ

භාණ්ඩ හා සේවාවෙළෙඳපොළ

- පරිභෝජන භාණ්ඩ හා සේවා හුවමාරු වෙයි.
- කුටුම්බ අංශය භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම් කරයි.
- නිෂ්පාදන ආයතන භාණ්ඩ හා සේවා සපයයි.
- භාණ්ඩ හා සේවා සඳහා සෘජු ඉල්ලුමක් පවතී.

සාධක සේවා වෙළෙඳපොළ

- සාධක සේවා හුවමාරු වෙයි.
- නිෂ්පාදන ආයතන සාධක සේවා ඉල්ලුම් කරයි.
- නිෂ්පාදන ආයතන වලට සාධක සේවා සපයන්නේ කුටුම්බ අංශය යි.
- සාධක සේවා සඳහා වක ඉල්ලුමක් පවතී.

- වෙළෙඳපොළ සමතුලිතය තීරණය වන ආකාරය

තරගකාරී වෙළෙඳපොළක ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අපේක්ෂාවන් තුලනය වන අවස්ථාව වෙළෙඳපොළ සමතුලිතය යි.

එහි දී ඉල්ලුම්කරුවන් ඉල්ලන ප්‍රමාණයත් සැපයුම්කරුවන් සපයන ප්‍රමාණයත් එකිනෙකට සමාන වෙන නිසා අධි ඉල්ලුම්ක් හෝ අධි සැපයුමක් හෝ දක්නට නොලැබෙන අතර ඉල්ලුම්කරුවන්ගේ අපේක්ෂිත මිල හා සැපයුම්කරුවන්ගේ අපේක්ෂිත මිල එකිනෙකට සමාන වන බැවින් අධි ඉල්ලුම් මිලක් හෝ අධි සැපයුම් මිලක් ඇති නොවේ.

- වෙළෙඳපොළ සමතුලිතය සත්‍ය වෙළෙඳපොළ තත්ත්වයක් නොව අපේක්ෂිත තත්ත්වයකි.
- වෙළෙඳපොළ සමතුලිතය වෙළෙඳපොළ දිශාව පෙන්නුම් කරන දර්ශකයකි.
- සමතුලිත තත්ත්වයෙන් වෙළෙඳපොළක් ඈත්වුණු විට නැවත ස්වයංක්‍රිය ව සමතුලිතය කරා ළඟා වේ.

වෙළෙඳපොළ සමතුලිතයක ඇති කොන්දේසි

1. අපේක්ෂිත ඉල්ලුම් මිල හා අපේක්ෂිත සැපයුම් මිල සමාන විය යුතු ය.
2. අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය හා අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය සමානවිය යුතු ය.
3. අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ශුන්‍ය විය යුතු ය.
4. අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශුන්‍ය විය යුතු ය.
5. පාරිභෝගික පැහැදම හා ව්‍යාපාරික අයහාරය සමාන විය යුතු ය.

වෙළෙඳපොල සමතුලිතය පෙන්විය හැකි විකල්ප ක්‍රම

1. ඉල්ලුම් සැපයුම් ලේඛන ඇසුරෙන්
2. ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් ( ප්‍රස්තාරයක් මගින්)
3. ඉල්ලුම් සැපයුම් සමීකරණ ඇසුරෙන්

1. ඉල්ලුම් සැපයුම් ලේඛන ඇසුරෙන්

| සලකා බලන භාණ්ඩයේ මිල (රු) | අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය ( ඒකක) | අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය ( ඒකක) |
|---|---|---|
| 0 | 300 | 0 |
| 10 | 250 | 50 |
| 20 | 200 | 100 |
| **30** | **150** | **150** |
| 40 | 100 | 200 |
| 50 | 50 | 250 |
| 60 | 0 | 300 |


ඉහත ලේඛනයට අනුව මිල රු. 30.00 දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 150 ක් වන අතර සැපයුම් ප්‍රමාණයද ඒකක 150 ක් වේඑබැවින්

සමතුලිත මිල රු 30

සමතුලිත ප්‍රමාණය 150 ( ඒකක) වේ

2. ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් ( ප්‍රස්තාරයක් මගින්)

ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය ඡේදනය වන අවස්ථාවේ ඉල්ලුම්කරුවන්ගේ හා සැපයුම්කරුවන්ගේ තීරණ තුලනය වන බැවින් වෙළඳපොළ සමතුලිතය තීරණය වේ




සමතුලිත මිල රු 30
සමතුලිත ප්‍රමාණය 150 ( ඒකක) වේ

3. ඉල්ලුම් සැපයුම් සමීකරණ ඇසුරෙන්

ඉල්ලුම් සමීකරණයට සැපයුම් සමීකරණය සමාන කරමින් සමතුලිත පහත ආකාරයට ගණනය කළ හැකිය

1 ඉහත ලේඛනයට අදාළ ඉල්ලුම් සමීකරණය ගොඩනගමු

Qd =a – bp

Qd = 300 – 5p

$$b = \frac{\Delta Qd}{\Delta P}$$

$$b = \frac{-50}{10}$$

b = -5

a = 300

2 ඉහත ලේඛනයට අදාළ සැපයුම් සමීකරණය ගොඩනගමු

Qs =a + bp

Qs = 0 +5p

Qs = 5p

$$b = \frac{\Delta Qd}{\Delta P}$$

$$b = \frac{50}{10}$$

b = 5

a = 0

3 සමතුලිතය සොයමු

Qd = Qs

300-5p =5p

-10p = -300

P = 30

P = 30

Qd = 300-5p

Qd = 300 – 5 ×30

Qd = 150

සමතුලිත මිල රු 30
සමතුලිත ප්‍රමාණය 150 ( ඒකක) වේ



Activity

තරගකාරි වෙළඳපොළක අලවි වන එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දක්වේ

Qd = 20 - p

QS = -8 + 6p

1 සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

1.2 සැපයුම් ශ්‍රිතය නොවෙනස්ව තිබියදී ඉල්ලුම් ශ්‍රිතය Qd = 36 -5p ලෙස වෙනස් වුවහොත් නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

1.3 ඉල්ලුම් ශ්‍රිතය නොවෙනස්ව තිබියදී සැපයුම් ශ්‍රිතය Qs = -10 + 4p ලෙස වෙනස් වුවහොත් නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

## අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය

කිසියම් මිලක දී සපයන ප්‍රමාණය ඉක්මවා ඉල්ලුම් කරන්නා වූ ප්‍රමාණය අධි ඉල්ලුම් ප්‍රමාණය වේ.

| අධි ඉල්ලුම් ප්‍රමාණය = (ඉල්ලුම් ප්‍රමාණය - සැපයුම් ප්‍රමාණය) |
|---|


කිසියම් මිලක දී ඉල්ලුම් කරන්නා වූ ප්‍රමාණය ඉක්මවා සපයන ප්‍රමාණය අධි සැපයුම් ප්‍රමාණය වේ.

| අධි සැපයුම් ප්‍රමාණය = ( සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය) |
|---|

| සලකා බලන භාණ්ඩයේ මිල (රු) | අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය ( ඒකක) | අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය ( ඒකක) | අධි ඉල්ලුම් ප්‍රමාණය | අධි සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 0 | 300 | 0 | 300 | -300 |
| 10 | 250 | 50 | 200 | -200 |
| 20 | 200 | 100 | 100 | -100 |
| **30** | **150** | **150** | **0** | **0** |
| 40 | 100 | 200 | -100 | 100 |
| 50 | 50 | 250 | -200 | 200 |
| 60 | 0 | 300 | -300 | 300 |

අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ශූන්‍ය අවස්ථාව සමතුලිත වේ.

අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනකින් පහත පරිදි පැහැදිලි කළ හැකිය.



- රු 50 දී

අධි සැපයුම = ( සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය)

250 - 50

අධි සැපයුම = 200

- රු 10 දී

අධි ඉල්ලුම් ප්‍රමාණය = (ඉල්ලුම් ප්‍රමාණය - සැපයුම් ප්‍රමාණය)

250-50

200

සමතුලිත මිලට ඉහළ සෑම මිලකදීම වෙළදපළ අධි සැපයුමක් පවතින අතර

සමතුලිත මිලට පහළ සෑම මිලකදීම වෙළදපළ අධි ඉල්ලුමක් පවතී

## අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල

කිසියම් ඒකක ප්‍රමාණයක දී සපයන මිල ඉක්මවා ඉල්ලුම් කරන්නා වූ මිල අධි ඉල්ලුම් මිල වේ.

| අධි ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල |
|---|

කිසියම් ඒකක ප්‍රමාණයක දී ඉල්ලුම් කරන මිල ඉක්මවා සපයන මිල අධිසැපයුම් මිල වේ.


| අධි සැපයුම් මිල = සැපයුම් මිල - ඉල්ලුම් මිල |
|---|

අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල පහත පරිදි සංඛ්‍යා සටහනකින් ඉදිරිපත් කළ හැකි ය.

| සලකා බලන භාණ්ඩයේ ප්‍රමාණය ( ඒකක) | අපේක්ෂිත ඉල්ලුම් මිල (රු) | අපේක්ෂිත සැපයුම් මිල (රු) | අධි ඉල්ලුම් මිල | අධි සැපයුම් මිල |
|---|---|---|---|---|
| 0 | 60 | 0 | 60 | -60 |
| 50 | 50 | 10 | 40 | -40 |
| 100 | 40 | 20 | 20 | -20 |
| **150** | **30** | **30** | **0** | **0** |
| 200 | 20 | 40 | -20 | 20 |
| 250 | 10 | 50 | -40 | 40 |
| 300 | 0 | 60 | -60 | 60 |

අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශූන්‍ය අවස්ථාව සමතුලිත වේ.

- අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ප්‍රස්තාර සටහනකින් ද පැහැදිලි කළ හැක.




- ඒකක 250 දී
- අධි සැපයුම් මිල = සැපයුම් මිල - ඉල්ලුම් මිල

50 - 10

= 40 (රු)

- රු 50 දී

අධි ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල

=50-10

=40 (රු)

සමතුලිත ප්‍රමාණය ඉහළ සෑම ප්‍රමාණයකදීම වෙළඳපළ අධි සැපයුම් මිලක් පවතින අතර

සමතුලිත ප්‍රමාණයට පහළ සෑම ප්‍රමාණයක දීම වෙළඳපළ අධි ඉල්ලුම් මිලක් පවතී

- අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල සමීකරණ ඇසුරෙන් ද පැහැදිලි කළ හැකි ය.

$$Qd = 300 - 5p$$

$$Qs = 5p$$

අධි ඉල්ලුම් සමීකරණය = ඉල්ලුම් සමීකරණය - සැපයුම් සමීකරණය

$$Ed = Qd - Qs$$

$$Ed = (300 - 5p) - (5p)$$

$$Ed = 300 - 5p - 5p$$

$$Ed = 300 - 10p$$

අධි සැපයුම් සමීකරණය = සැපයුම් සමීකරණය - ඉල්ලුම් සමීකරණය

$$Es = Qs - Qd$$

$$Es = (5p) - (300 - 5p)$$

$$Es = 5p - 300 + 5p$$

$$Es = -300 + 10p$$

1 අධි ඉල්ලුම් සමීකරණය ඇසුරින් සමතුලිත මිල සොයන්න

$Ed = 300 - 10p$

$0 = 300 - 10p$

$10p = 300$

$P = 30$

2 අධි සැපයුම් සමීකරණය ඇසුරින් සමතුලිත මිල සොයන්න

.............................................................................................................


.............................................................................................................

.............................................................................................................

.............................................................................................................


## ආර්ථික අතිරික්තය

ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සමතුලිත හුවමාරුව තුලින් ලාභ අත්පත්කර ගනී.මෙලෙස දෙපිරිසම අත්කරගන්නා වාසිය ආර්ථික අතිරික්තයයි




## පාරිභෝගික අතිරික්තය

වෙළෙඳපොළේ හුවමාරු කරගනු ලබන සමතුලිත භාණ්ඩ ප්‍රමාණය සඳහා පාරිභෝගිකයන් ගෙවීමට කැමැති මිල ක් සත්‍ය වශයෙන් ම ඔහු ගෙවන මිලත් අතර වෙනස පාරිභෝගික අතිරික්තය යි.



පාරිභෝගික අතිරික්තය ගණනය කරනුයේ මෙසේ ය.


$$\frac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{සමතුලිත මිල})}{2} \times \text{සමතුලිත ප්‍රමාණය}$$

$$\text{පාරිභෝගික අතිරික්තය} = \frac{(60 - 30)}{2} \times 150$$

$$= 2250(\text{රු})$$

## නිෂ්පාදක අතිරික්තය

සැපයුම්කරුවන් භාණ්ඩ සඳහා අපේක්ෂා කරන අවම මිලත් ( ආන්තික පිරිවැය) සත්‍ය වශයෙන් ම ඔවුන්ට වෙළෙඳපොළේ දී ලැබෙන මිලත් අතර වෙනස නිෂ්පාදක අතිරික්තයයි.




නිෂ්පාදක අතිරික්තය ගණනය කරනුයේ මෙසේ ය.

$$= \frac{\text{සමතුලිත මිල} - \text{අවම සැපයුම් මිල}) \times \text{සැපයුම් ප්‍රමාණය}}{2}$$

නිෂ්පාදක අතිරික්තය $= \frac{(30 - 00) \times 150}{2}$

$= 2250$(රු)

- සමතුලිතයේදි නිෂ්පාදක අයභාරය හෙවත් පාරිභෝගික පැහැදම





නිෂ්පාදක අයභාරය $= p \times Q$

$= 30 \times 150$

$= 4500$ (රු)


- සමතුලිතයේදී ආර්ථික ලාභය හෙවත් ආර්ථික අතිරික්තය
  මෙය පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය එකතුකිරීමෙන්ද ලබාගත හැකිය




- ආර්ථික අතිරික්තය $= \left(\frac{60 - 00}{2}\right) \times 150$
  $= 4500$ (රු)

- සමතුලිතයේදී විචල්‍ය පිරිවැය

- විචල්‍ය පිරිවැය $= \left(\frac{30 - 00}{2}\right) \times 150$
  $= 2250$(රු)




නිෂ්පාදකයාගේ මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය අඩු කළ විට ඉතිරිවන ප්‍රමාණය නිෂ්පාදක අතිරික්තයයි.

Activity

තරඟකාරී වෙළඳපොළේ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහතින් දැක්වේ.

$$Qd = 560 - 8p$$

$$Qs = -40 + 4p$$

මෙහි Qd හා Qs යනු ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ දහස්වලින් වන අතර p මගින් පරිගණකයක මිල රුපියල් වලින් දැක්වේ.

1 ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්ථාර සටහනක ඇද සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය දක්වන්න. (ල.04)

[මේ සඳහා ප්‍රස්ථාර කොළයක් භාවිතා කර සුදුසු පරිමාණයක් යොදාගත යුතු වේ.]

2 සමතුලිතයේදී

I පාරිභෝගික අතිරික්තය

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

II නිෂ්පාදක අතිරික්තය

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

III ආර්ථික අතිරික්තය

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

IV විචල්‍ය පිරිවැය

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

V නිෂ්පාදක අයභාරය

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

## වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වීම


තරගකාරී වෙළෙඳපොළක සමතුලිත මිලක දී අනෙකුත් සාධක බලපෑම නිසා ඉල්ලුම් වක්‍රය හෝ සැපයුම් වක්‍රය හෝ වමට හෝ දකුණට විතැන් වීම නිසා වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වේ.


- වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වන ආකාර පහත පරිදි වේ.
  - සැපයුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී ඉල්ලුම් වක්‍රය වෙනස් වීම
  - ඉල්ලුම් වක්‍රය ස්ථාවර ව තිබිය ද සැපයුම් වක්‍රය වෙනස් වීම
  - ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර දෙක ම එක වර වෙනස් වීම

සැපයුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී ඉල්ලුම් වක්‍රය වෙනස් වීම

ඉල්ලුම් වක්‍රය වමට වෙනස් වීම

ඉල්ලුම් වක්‍රය දකුණට වෙනස් වීම







සැපයුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී ඉල්ලුම් වක්‍රය වමට වෙනස් වීම නිසා සමතුලිත මිල හා ප්‍රමාණය යන 02 කම අඩු වේ


සැපයුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී ඉල්ලුම් වක්‍රය දකුණට වෙනස් වීම නිසා සමතුලිත මිල හා ප්‍රමාණය යන 02 කම වැඩි වේ

ඉල්ලුම් වක්‍රය ස්ථාවර ව තිබිය ද සැපයුම් වක්‍රය වෙනස් වීම

සැපයුම් වක්‍රය වමට වෙනස් වීම




සැපයුම් වක්‍රය දකුණට වෙනස් වීම




ඉල්ලුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී සැපයුම් වක්‍රය වමට වෙනස් වීම නිසා සමතුලිත මිල ඉහළ යන අතර ප්‍රමාණය පහළ යයි


ඉල්ලුම් වක්‍රය ස්ථාවර ව තිබිය දී සැපයුම් වක්‍රය දකුණට වෙනස් වීම නිසා සමතුලිත මිල පහළ යන අතර ප්‍රමාණය ඉහළ යයි

ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර දෙක ම එක වර වෙනස් වීම

සැපයුම් වක්‍රය හා ඉල්ලුම් වක්‍රය වමට වෙනස් වීම





සැපයුම් වක්‍රය හා ඉල්ලුම් වක්‍රය දකුණට වෙනස් වීම




ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය යන දෙකම  වමට විතැන් වීමේදී සමතුලිත මිල ස්ථාවර ව තිබිය දී සමතුලිත ප්‍රමාණය පමණක් අඩු වේ

ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය යන දෙකම දකුණට විතැන් වීමේදී සමතුලිත මිල ස්ථාවර ව තිබිය දී සමතුලිත ප්‍රමාණය පමණක් වැඩි වේ

මීට අමතරව ඉල්ලුම සමාන ප්‍රතිශතයකින් වැඩි වන විට සැපයුම සමාන ප්‍රතිශතයකින් අඩු වීම මගිනද සමතුලිතය වෙනස්වේ




මෙලෙස ඉල්ලුම හා සැපයුම ප්‍රතිවිරුද්ධ ලෙස වෙනස්වීමේදි වෙළඳපළ සමතුලිත ප්‍රමාණය වෙනස් නොවන අතර සමතුලිත මිල පමණක් වෙනස් වේ




## මිල ඉල්ලුම් නම්‍යතාව

මිලෙහි ප්‍රතිශත වෙනසකට සාපේක්ෂ ව ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස් වීම මැන දැක්වීම මිල ඉල්ලුම් නම්‍යතාව ලෙස හඳුන්වයි.

$$\text{මිල ඉල්ලුම් නම්‍යතාව} = \frac{\text{ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස}}{\text{මිලෙහි ප්‍රතිශත වෙනස}}$$

1 තරගකාරී වෙළඳපළක සහල් මිල 20 % කින් වැඩිවන විට සහල් ඉල්ලුම 10% කින් අඩු විය සහල් මිල ඉල්ලම් නම්‍යතාව ගණනය කරන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

මිල ඉල්ලුම් නම්‍යතාව

ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

චාප මිල ඉල්ලුම් නම්‍යතාව

$$AEd = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P1 + P2}{Q1 + Q2}$$

ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව

ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී, ඉල්ලුම් වක්‍රයේ කිසියම් ලක්ෂ්‍යයක මිලේ සුළු ප්‍රතිශතක වෙනසකට අනුව ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස මැන දැක්වීම ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාවි.

$$Ed = \frac{\frac{\Delta Q}{Q} \times 100}{\frac{\Delta P}{P} \times 100} = \frac{\Delta Q}{Q} \div \frac{\Delta P}{P} = \frac{\Delta Q}{Q} \times \frac{P}{\Delta P} = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$\Delta Qd$ → ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස

$\Delta P$ → මිලෙහි වෙනස

$\frac{\Delta Qd}{\Delta P}$ → ඉල්ලුම් වක්‍රයේ බැවුම් පරස්පරය

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 400<br>200 |

ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව සොයමු

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{-200}{10} \times \frac{10}{400}$$

Edp = - 0.5

Activity

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 250<br>150 |

1 ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව සොයන්න

………………………………………………………………………………………………


………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

ඉහළ සිට පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක පහළට ගමන් කරන විට ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව අපරිමිතයේ ∞ සිට 0 දක්වා විහිදී යයි.

පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක සෑම ලක්ෂ්‍යයකම බෑවුම් පරස්පරය ස්ථාවර වන බැවින් ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව ∞ සිට 0 දක්වා වෙනස් වන්නේ ඒ ඒ ලක්ෂ්‍යයන්හි දී මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර අනුපාතිකය පහළ යාම නිසා ය.




A හි ped = $\frac{\Delta Q}{\Delta p} \times \frac{p}{Q} = \frac{50}{10} \times \frac{40}{0} = \infty$

B හි ped = $\frac{\Delta Q}{\Delta p} \times \frac{p}{Q} = \frac{50}{10} \times \frac{30}{50} = -3$

C හි ped = $\frac{\Delta Q}{\Delta p} \times \frac{p}{Q} = \frac{50}{10} \times \frac{20}{100} = -1$

D හි ped = $\frac{\Delta Q}{\Delta p} \times \frac{p}{Q} = \frac{50}{10} \times \frac{10}{150} = -0.33$

E හි ped = $\frac{\Delta Q}{\Delta p} \times \frac{p}{Q} = \frac{50}{10} \times \frac{0}{200} = 0$

ඉල්ලුම් වක්‍රය මත A සිට E දක්වා පහළට ගමන් කරන විට ලක්ෂ්‍ය නම්‍යතාව∞ සිට 0 දක්වා අඩු වේ.

චාප මිල ඉල්ලුම් නම්‍යතාව

ඉල්ලුම් වක්‍රයේ නිශ්චිත ලක්ෂ දෙකක් අතර ප්‍රදේශයේ මිලෙහි විශාල ප්‍රතිශතක වෙනසකට සාපේක්ෂ ව ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස මැන දැක්වීම චාප මිල ඉල්ලුම් නම්‍යතාව වේ. එය ගණනය කරන සූත්‍රය පහත දැක්වේ.

$$AEd = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P1 + P2}{Q1 + Q2}$$


AEd - චාප ඉල්ලුම් නම්‍යතාව

$\Delta Qd$ - ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස

$\Delta P$ - මිලේ වෙනස

$\frac{P1 + P2}{2}$ - ඉල්ලුම් ප්‍රමාණයේ සාමාන්‍යය

$\frac{P1 + P2}{2}$





| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 400<br>200 |

චාප මිල ඉල්ලුම් නම්‍යතාව සොයමු

$$AEd = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P1 + P2}{Q1 + Q2}$$

$$AEd = \frac{-200}{10} \times \frac{10 + 20}{400 + 200}$$

AEd = - 1


Activity

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 250<br>150 |

1 චාප මිල ඉල්ලුම් නම්‍යතාව සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම අනුව මිල ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රභේද 5ක් හඳුනාගත හැකි ය.

I. ped = 0) පූර්ණ අනම්‍ය ඉල්ලුම

II. ped <1) නම්) අනම්‍ය ඉල්ලුම

III. ped = 1) නම්) ඒකීය නම්‍ය ඉල්ලුම

IV. ped > 1) නම්) නම්‍ය ඉල්ලුම

V ped = $\propto$) නම්) පූර්ණ නම්‍ය ඉල්ලුම

- පූර්ණ අනම්‍ය ඉල්ලුම **( Perfectly Inelastic Demand )**


යම් භාණ්ඩයක මිල ප්‍රතිශතයකින් වෙනස් වුව ද එහි ඉල්ලුම් ප්‍රමාණය නොවෙනස් ව පවතී නම් එය පූර්ණ අනම්‍ය ඉල්ලුම වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 5 | 100 |
| 10 | 100 |

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{0}{5} \times \frac{5}{100}$$

Edp = -0




- පූර්ණ අනම්‍ය ඉල්ලුමේ දී ඉල්ලුම් වක්‍රය සිරස් අක්ෂයට සමාන්තරව පිහිටයි.
- ඉල්ලුම් වක්‍රයේ ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව ශුන්‍ය වේ.

- අනම්‍ය ඉල්ලුම - **Inelastic demand**


- යම් භාණ්ඩයක මිල වෙනස් වන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වේ නම් එය අනම්‍ය ඉල්ලුම වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 5 | 100 |
| 10 | 75 |

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{-25}{5} \times \frac{5}{100}$$

Edp = -0. 25




අනම්‍ය ඉල්ලුමක දී ඉල්ලුම් වක්‍රයේ මැද ලක්ෂ්‍යයට පහළින් ඕනෑම ස්ථානයක නම්‍යතා සංගුණකය 1ට අඩු අගයක් ගනී.

- ඒකීය නම්‍ය ඉල්ලුම - **Unitay elasticity of demand**


යම් භාණ්ඩයක මිල වෙනස් වන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වේ නම් එය ඒකීය නම්‍ය ඉල්ලුම වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 5 | 100 |
| 10 | 50 |

$$AEd = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P1 + P2}{Q1 + Q2}$$

$$AEd = \frac{-50}{5} \times \frac{5 + 10}{100 + 50}$$

AEd = 1




ඒකීය නම්‍ය ඉල්ලුමේ දී ඉල්ලුම් වක්‍රය සෘජුකෝණාස්‍රාකාර බහුවලයක් වේ.

- නම්‍ය ඉල්ලුම - **elastic demand.**


යම් භාණ්ඩයක මිල වෙනස් වන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වේ නම් එය නම්‍ය ඉල්ලුම වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10 | 400 |
| 15 | 100 |

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{-300}{5} \times \frac{10}{400}$$

Edp = -1.5




නම්‍ය ඉල්ලුමේ දී ඉල්ලුම් වක්‍රයේ මැද ලක්ෂ්‍යයට ඉහළින් පිහිටි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතා සංගුණකය 1ට වැඩි අගයක් ගනී.

- පූර්ණ නම්‍ය ඉල්ලුම - **Perfectly elastic demand.**


යම් භාණ්ඩයක මිල ඉතා ම සුළු ප්‍රතිශතයකින් වෙනස් වන විට එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඉතාම විශාල ප්‍රතිශතයකින් වෙනස් වේ නම් එය පූර්ණ නම්‍ය ඉල්ලුම ලෙස හඳුන්වයි

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10 | 400 |
| 10 | 100 |


$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$$

$$Edp = \frac{-300}{0} \times \frac{10}{400}$$

Edp = ∝



ඉල්ලුම් වක්‍රයේ බෑවුම හා මිල ඉල්ලුම් නම්‍යතාවය




ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කරන විට ඉල්ලුම් වක්‍රයේ බෑවුම $\frac{\Delta Qd}{\Delta P}$ ස්ථාවර වුවත් ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කරන විට මිල ඉල්ලුම් නම්‍යතාව ක්‍රමයෙන් අඩුවේ නම්‍යතාවයේදී $Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Q}$ බෑවුමට අමතරව $\frac{P}{Q}$ පවතින බැවින් එය ක්‍රමයෙන් ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කරන විට අඩුවන බැවින් නම්‍යතාව අඩුවේ

## මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක

වෙළෙඳපොළේ භාණ්ඩයෙන් භාණ්ඩයට මිල ඉල්ලුම් නම්‍යතාව වෙනස් වේ. ඒ අනුව සමහර භාණ්ඩ සඳහා අනම්‍ය ඉල්ලුමක් ද සමහර භාණ්ඩවලට නම්‍ය ඉල්ලුමක් ද ඇති වේ. මෙසේ භාණ්ඩයකට ඇති ඉල්ලුම අනම්‍ය බව නම්‍ය බව තීරණය කරන සාධක මිල ඉල්ලුම් නම්‍යතා තීරක ලෙස හැඳින්වේ.

- මිල ඉල්ලුම් නම්‍යතා තීරක පහත දැක් වේ.

1. සලකා බලන භාණ්ඩයක සුඛෝපභෝගී බව හෝ අත්‍යවශ්‍ය බව


2. භාණ්ඩයකට ඇති ආදේශක සංඛ්‍යාව හා ඒවායේ සමීප බව පාරිභෝගික ආදායමෙන් භාණ්ඩය මිල දී ගැනීමට වැය කරන වැදගත්කම

3. භාණ්ඩයක ඇති විකල්ප භාවිත සංඛ්‍යාව

4. මිල වෙනස් වීම හේතුවෙන් එයට හැඩ ගැසීමට ගත වන කාලය

### මිල ඉල්ලුම් නම්‍යතාව හාපාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය

මිල ඉල්ලුම් නම්‍යතාව දී ඇති විටෙක අදාළ භාණ්ඩයේ මිල වෙනස් වීම මත පාරිභෝගික පැහැදම වෙනස් වන ආකාරය නිශ්චය කළ හැකි ය. මිල ඉල්ලුම් නම්‍යතාව හා පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය අතර සම්බන්ධතාවක් පවතී.



ඉහත ප්‍රස්තාරයට අනුව නම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේ දී මිල පහළ යන විට ව්‍යාපාරික අයභාරය ඉහළ යයි. ඒකීය නම්‍ය ලක්ෂ්‍යයේ දී ව්‍යාපාරික අයභාරය උපරිම වෙයි. අනම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේ දී මිල පහළ යන විට ව්‍යාපාරික අයභාරය පහළ යයි.

ඉල්ලුම් නම්‍යතාව පාරිභෝගික මුළු පැහැදම අතර පවතින සම්බන්ධතාව පහත වගුව ඇසුරෙන් ද පෙන්විය හැකි ය.

| නම්‍යතාව | නම්‍යතා සංගුණකයේ අගය | මිල වෙනස් වීම | පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය |
|---|---|---|---|
| අපරිමිත නම්‍යතාව | Ped =∝ | ඉහළ යාම<br>පහළ යාම | ශූන්‍ය වේ<br>බලපෑම අපරිමිත වේ |
| නම්‍ය | Ped> 1 | ඉහළ යාම<br>පහළ යාම | පහත වැටේ<br>ඉහළ යයි |
| ඒකීය | Ped= 1 | ඉහළ යාම<br>පහළ යාම | වෙනස් නොවේ<br>වෙනස් නොවේ |
| අනම්‍ය | Ped< 1 | ඉහළ යාම<br>පහළ යාම | ඉහළ යාම<br>පහළ යාම |
| ශූන්‍ය ( පූර්ණ අනම්‍ය ) | Ped= 1 | ඉහළ යාම<br>පහළ යාම | ඉහළ යාම<br>පහළ යාම |

- මිල ඉල්ලුම් නම්‍යතාව ප්‍රායෝගික ව වැදගත් වන අවස්ථා නම්,

- පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයාට හා ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයනට තීරණ ගැනීම සඳහා නම්‍යතා සංකල්පය වැදගත් වේ.
- භාණ්ඩයක මිල වැඩි / අඩු වන විට පාරිභෝගික පැහැදම / නිෂ්පාදන අයභාරයට කෙරෙන බලපෑම ප්‍රරෝකථනය කළ හැකි වීම.
- ආදායම උපරිම කෙරෙන අවස්ථාවක සහ නිමැවුම සඳහා තීරණය කළ හැකි වීම
- ව්‍යාපාර ආයතනයකට ඇති ඒකාධිකාරි ශක්තිය නිශ්චය කළ හැකි වීම
- ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා භාවිත කළ හැකි වීම
- වක්‍ර බදු පැනවීමේ දී අදාළ භාණ්ඩ තෝරාගැනීම

## හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

වෙළෙඳපොළේ හුවමාරු වන එක් භාණ්ඩයක මිල වෙනස් වීම තවත් භාණ්ඩයක ඉල්ලුම වෙනස් වීමට බලපායි. ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී සම්බන්ධිත භාණ්ඩයක මිලේ ප්‍රතිශතක වෙනසට සාපේක්ෂ ව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ ප්‍රතිශතක වෙනස මැන දැක්වීම හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ලෙස හැඳින්වේ.

$$Exy = \frac{\Delta Qx}{\Delta Py} \times \frac{Py}{Qx}$$

$Exy$ - හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

$\Delta Qdx$ ⟶ සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස

$\Delta Py$ ⟶ සම්බන්ධිත භාණ්ඩයේ මිලේ වෙනස

$Py$ - ⟶ සම්බන්ධිත භාණ්ඩයේ පළමු මිල

$Qx$- ⟶ සලකා බලන භාණ්ඩයේ පළමු ඉල්ලුම් ප්‍රමාණය

| Y භාණ්ඩයේ මිල (රු) | X ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 400<br>200 |

හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

$$Exy = \frac{\Delta Qx}{\Delta Py} \times \frac{Py}{Qx}$$

$$Exy = \frac{-200}{10} \times \frac{10}{400}$$

$Exy$ = - 0.5

Activity

| Y භාණ්ඩයේ මිල (රු) | X ඉල්ලුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10 | 250 |
| 20 | 150 |


1 හරස් මිල ඉල්ලුම් නම්‍යතාව

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………



හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ සම්බන්ධිත භාණ්ඩවල මිල හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය. එසේ හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ ආදේශන භාණ්ඩවල ය.

හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍණ අගයක් ගනු ලබන්නේ සම්බන්ධිත භාණ්ඩවල මිල හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය. එසේ හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ඍණ අගයක් ගන්නේ අනුපූරක භාණ්ඩවල ය.

හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ ප්‍රායෝගික ව වැදගත් වන ආකාර

- භාණ්ඩ වර්ග අතර පවතින අන්තර් සම්බන්ධතාව විග්‍රහ කිරීමට
- භාණ්ඩ සඳහා වෙළෙඳපොළේ තරගකාරීත්වය තීරණය කිරීමට
- භාණ්ඩවල හා සේවාවල සාපේක්ෂ ඉල්ලුම වෙනස් වීම් පුරෝකථනය කිරීමට

## ආදායම් ඉල්ලුම් නම්‍යතාව

පාරිභෝගික ආදායම වෙනස් වන විට එක් එක් භාණ්ඩ වර්ග සඳහා පවතින ඉල්ලුම වෙනස් වන ආකාරය එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනී.

ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබියදී , පාරිභෝගික ආදායම් ප්‍රතිශත වෙනසකට සාපේක්ෂ ව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රතිශතක වෙනස මැන දැක්වීම ආදායම් ඉල්ලුම් නම්‍යතාව වේ.

$$\text{ආදායම් ඉල්ලුම් නම්‍යතාව} = \frac{\text{ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස}}{\text{ආදායමේ ප්‍රතිශත වෙනස}}$$

$$Yed = \frac{\Delta Q}{\Delta y} \times \frac{y}{Q}$$

Yed = ආදායම් ඉල්ලුම් නම්‍යතාව
$\Delta Q$ = ඉල්ලුම් වෙනස
$\Delta y$ =ආදායමේ වෙනස
$y$ =පළමු ව දී ඇති ආදායම
Q = පළමු ආදායම යටතේ පැවති ඉල්ලුම


| X ඉල්ලුම් ප්‍රමාණය (ඒකක | ආදායම |
|---|---|
| 10<br>20 | 400<br>200 |

ආදායම් ඉල්ලුම් නම්‍යතාව

$$Yed = \frac{\Delta Q}{\Delta y} \times \frac{y}{Q}$$

$$Yed = \frac{10}{-200} \times \frac{400}{10}$$

Yed = -2




Activity

| X ඉල්ලුම් ප්‍රමාණය (ඒකක | ආදායම |
|---|---|
| 10<br>20 | 250<br>150 |

1 ආදායම් ඉල්ලුම් නම්‍යතාව

..........................................................
..........................................................
..........................................................
..........................................................
..........................................................
..........................................................
..............................................



ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ ආදායමේ වෙනස හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ වෙනස අතර අනුලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය. එහි ධන සම්බන්ධතාවක් පවතින්නේ සාමාන්‍ය භාණ්ඩවල ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන එකට වැඩි අගයක් ගනු ලබන්නේ ආදායම් ප්‍රතිශතක වෙනසට වඩා වැඩි ප්‍රතිශතයකින් සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩි වන විට දී ය. ආදායම් ඉල්ලුම් නම්‍යතා ධන අගය එකට වැඩි අගයක් ගන්නේ සුඛෝපභෝගී භාණ්ඩවල ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන එකට අඩු අගයක් ගනු ලබන්නේ ආදායමේ ප්‍රතිශතක වෙනසට වඩා අඩු ප්‍රතිශතයකින් සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩි වන විට දී ය. ආදායම ඉල්ලුම් නම්‍යතාව ධන අගය එකට අඩු වන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩවල ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගනු ලබන්නේ ආදායමේ වෙනස හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ වෙනස අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතින විට දී ය. ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගන්නේ බාල භාණ්ඩවල ය.

- ආර්ථික විග්‍රහයන් සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව යොදාගත හැකි ආකාර කිහිපයක් පහත දැක්වේ.
  - අත්‍යවශ්‍ය භාණ්ඩ , සුඛෝපභෝගී භාණ්ඩ හා බාල භාණ්ඩ යනුවෙන් වර්ග කිරීමට
  - ආදායම් වෙනස් වීම මත වෙළෙඳ පොළේ භාණ්ඩවලට ඇති ඉල්ලුම වෙනස් වන ආකාරය පුරෝකථනය කිරීමට

## සැපයුම් මිල නම්‍යතාව

සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී භාණ්ඩයේ මිල වෙනස් වීම කෙරෙහි සැපයුම් ප්‍රමාණය දක්වන සංවේදීතාව සැපයුම් මිල නම්‍යතාව යි.

එනම් සලකා බලන භාණ්ඩයේ මිල යම් ප්‍රතිශතයකින් වෙනස් වන විට සැපයුම් ප්‍රමාණය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වේ ද යන්න මැන දැක්වීම සැපයුම් මිල නම්‍යතාවයෙන් සිදු කරයි. සැපයුම් නම්‍යතාව ලෙසින් ව්‍යවහාර වන්නේ ද සැපයුම් මිල නම්‍යතාව ම ය.

- සැපයුම් මිල නම්‍යතාව පහත ආකාරයට ගණනය කළ හැකි ය.

$$\text{සැපයුම් මිල නම්‍යතාව} = \frac{\text{සැපයුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස}}{\text{මිලේ ප්‍රතිශත වෙනස}}$$

සැපයුම් මිල නම්‍යතාව

ලක්ෂ්‍යය මිල සැපයුම් නම්‍යතාව

$$Eds = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P}{Q}$$

චාප මිල සැපයුම් නම්‍යතාව

$$AEs = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P1 + P2}{Q1 + Q2}$$

ලක්ෂ්‍යය මිල සැපයුම් නම්‍යතාව

සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී, සැපයුම් වක්‍රයේ කිසියම් ලක්ෂ්‍යයක මිලේ සුළු ප්‍රතිශතක වෙනසකට අනුව සැපයුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස මැන දැක්වීම ලක්ෂ්‍යය මිල සැපයුම් නම්‍යතාවී.

සැපයුම් මිල නම්‍යතාව (ES) $= \frac{\Delta QS\%}{\Delta P\%}$

$$= \frac{\frac{\Delta QS}{QS} \times 100}{\frac{\Delta P}{P} \times 100}$$

$$= \frac{\Delta QS}{QS} \times \frac{\Delta P}{P}$$

$$ES = \frac{\Delta QS}{\Delta P} \times \frac{P}{Q}$$

$$Eds = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P}{Q}$$

**ES** = සැපයුම් මිල නම්‍යතාව

**Δ QS** = සැපයුම් ප්‍රමාණයේ වෙනස

**Δ P** = මිලේ වෙනස

**P** = භාණ්ඩයේ මිල (මුල් මිල)

**QS** = භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය (මුල් ප්‍රමාණය)

| මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10 | 200 |
| 20 | 400 |

ලක්ෂ්‍යය මිල සැපයුම් නම්‍යතාව සොයමු

$$Eds = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P}{Q}$$

$$Eds = \frac{200}{10} \times \frac{10}{200}$$

Eds = 1


Activity

| මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10 | 150 |
| 20 | 250 |

1 ලක්ෂ්‍යය මිල සැපයුම් නම්‍යතාව සොයන්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

චාප මිල සැපයුම් නම්‍යතාව

ලක්ෂ්‍ය සැපයුම් නම්‍යතාව න්‍යායාත්මක සංකල්පයකි. විශාල මිල වෙනස් වීමක නම්‍යතාව ගණනය කිරීම සඳහා ලක්ෂ්‍ය සැපයුම් නම්‍යතා සංකල්පය යෝග්‍ය නොවේ.

ඊට හේතුව වන්නේ එක ම ප්‍රමාණයකින් මිල අඩුවීමක දී හෝ වැඩිවීමක දී හෝ විශාල වෙනස්කම් සහිත නම්‍යතා අගය දෙකක් ලැබීම යි.

මේ නිසා විශාල මිල වෙනස්කම් හා සම්බන්ධ ව සැපයුම් නම්‍යතාව ගණනය කිරීම සඳහා චාප සැපයුම් නම්‍යතාව යොදා ගනී.

$$\text{චාප සැපයුම් නම්‍යතාව} = \frac{\Delta QS}{\Delta P} \times \frac{\frac{P_1+P_2}{2}}{\frac{Q_1+Q_2}{2}} = \frac{\Delta QS}{\Delta P} \times \frac{P_1+P_2}{Q_1+Q_2}$$

$$AEs = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P1+P2}{Q1+Q2}$$

මෙම සූත්‍රයෙහි,

**ΔQS** = සැපයුම් ප්‍රමාණයේ වෙනස් වීම.

**Δ P** = මිලේ වෙනස් වීම්

$\frac{P_1+P_2}{2}$ = සාමාන්‍ය මිල

$\frac{Q_1+Q_2}{2}$ = සාමාන්‍ය ප්‍රමාණය


| මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 200<br>400 |

චාප මිල සැපයුම් නම්‍යතාව සොයමු

$$AEs = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P1+P2}{Q1+Q2}$$

$$AEs = \frac{200}{10} \times \frac{10+20}{400+200}$$

AEs = 1


Activity

| මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක |
|---|---|
| 10<br>20 | 150<br>250 |

1 චාප මිල සැපයුම් නම්‍යතාව සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

සැපයුම් නම්‍යතා සංගුණකය සඳහා ලැබෙන අගය ශුන්‍යයේ (0) සිට අපරිමිත (α) දක්වා වෙනස් වේ. එම සංගුණකයෙහි අගය පදනම් කරගනිමින් සැපුයම් මිල නම්‍යතා ප්‍රභේද පහක් දැක්විය හැකි ය.

1. ඒකීය සැපයුම් නම්‍යතාව
2. එකට අඩු සැපයුම් නම්‍යතාව
3. එකට වැඩි සැපයුම් නම්‍යතාව
4. පූර්ණ නම්‍ය සැපයුම් නම්‍යතාව
5. පූර්ණ අනම්‍ය සැපයුම් නම්‍යතාව


- ඒකීය සැපයුම් නම්‍යතාව

සැපයුම් කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වන ප්‍රතිශතයෙන් ම සැපයුම් ප්‍රමාණය ද වෙනස් වේ නම් එය ඒකීය නම්‍ය සැපයුමයි.

- මෙහි දී සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය එක (1) වේ.
- මූල ලක්‍ෂ්‍යය හරහා ගමන් කරන සෑම සැපයුම් වක්‍රයක ම සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය එක වේ.

`• ඊට හේතුව මූල ලක්‍ෂ්‍යයෙන් ආරම්භ වන සැපයුම් වක්‍රයක මිල සහ සැපයුම් ප්‍රමාණය අතර අනුපාතය සමාන වීම යි.

පහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන්නේ ඒකීය සැපයුම් නම්‍යතාවක් සහිත සැපයුම් වක්‍ර ය.





Qs =bp වර්ගයේ සමීකරණය

ඉහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන S1, S2 සහ S3 සැපයුම් වක්‍රවල (ΔP / ΔQs) අගය සැම විට ම P / Qs වලට සමාන වේ. මේ නිසා නම්‍යතාව සැම විට ම ඒකීය වේ.

2. එකට අඩු සැපයුම් නම්‍යතාව

අනෙකුත් සාධක ස්ථාවර ම තිබිය දී භාණ්ඩයක මිල වෙනස් වන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් සැපයුම් ප්‍රමාණය වෙනස් වන්නේ නම් එය එකට අඩු (අනම්‍ය සැපයුම් නම්‍යතාව) සැපයුම් තත්ත්වයකි.

එහි දී සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය එකට අඩු (< 1) වේ. තිරස් අක්ෂය හරහා ගමන් කරන සැම සරල රේඛීය සැපයුම් වක්‍රයක ම ඇත්තේ එකට අඩු සැපයුම් නම්‍යතාවකි. පහත ප්‍රස්තාර සටහනේ දැක්වා ඇත්තේ එකට අඩු සැපයුම් නම්‍යතාවකින් යුත් සැපයුම් වක්‍රය යි.




Qs = a + bp වර්ගයේ සමීකරණය

ඉහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන තිරස් අක්ෂය හරහා ගමන් කරන S සැපයුම් වක්‍රයෙහි නම්‍යතා සංගුණයෙහි අගය එකට අඩු වේ.


| |
|---|
| සැපයුම් වක්‍රය ඉහළට ගමන් කරන විට නම්‍යතා සංගුණකයේ අගය එකට ආසන්න වන තෙක් ඉහළ යයි. ඊට හේතුව මිලක් සැපයුම් ප්‍රමාණයක් අතර අනුපාතය ඉහළ යෑම යි. |

### 3. එකට වැඩි සැපයුම් නම්‍යතාව

අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී මිල වෙනස් වන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් සැපයුම් ප්‍රමාණය වෙනස් වේ නම් එය එකට වැඩි සැපයුම් නම්‍යතාව(නම්‍ය සැපයුම)යි. මෙහි දී සැපයුම් නම්‍යතාව සඳහා ලැබෙන අගය එකට වැඩි (>1) වේ. සිරස් අක්ෂයට හරහා ගමන් කරන සෑම සැපයුම් වක්‍රයක ම ඇත්තේ එකට වැඩි සැපයුම් නම්‍යතාවයි.

- පහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන්නේ සැපයුම් නම්‍යතා සංගුණකය එකට වැඩි අගයකින් යුත් සැපයුම් වක්‍රයකි.

Qs = -a + bp වර්ගයේ සමීකරණය





ප්‍රස්තර සටහනෙහි දැක්වෙන S සැපයුම් වක්‍රයෙහි නම්‍යතා අගය එකට වැඩි වේ.

| |
|---|
| සැපයුම් වක්‍රය ඉහළට ගමන් කරන විට වක්‍රය දිගේ ඉහළට යත් ම එම එකට වැඩි අගය ක්‍රමයෙන් අඩු වී එකට සමීප වේ. ඊට හේතුව මිල සහ සැපයුම් ප්‍රමාණය අතර අනුපාතය පහළ යාම යි. |

4. පූර්ණ අනම්‍ය සැපයුම් නම්‍යතාව


අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී භාණ්ඩයේ මිලේ ඇති වන වෙනස් වීමකට ප්‍රතිචාර වශයෙන් භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණයෙහි කිසි දු වෙනසක් සිදු නොවේ නම් ඒ පූර්ණ අනම්‍ය සැපයුම් නම්‍යතාවයි.




එහි දී සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය ශූන්‍ය (0) වේ. සැපයුම් වක්‍ර සිරස් අක්ෂයට සමාන්තර සරල රේඛාවක් සේ

5. පූර්ණ නම්‍ය සැපයුම් නම්‍යතාව

අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී භාණ්ඩයේ මිලෙහි ඇති වන ඉතා සුළු ප්‍රතිශතක වෙනස් වීමකට (ශූන්‍ය මිල මට්ටමේ වෙනසකට) ප්‍රතිචාර වශයෙන් සැපුයම් ප්‍රමාණය විශාල වශයෙන් වෙනස් වේ නම් ඒ පූර්ණ නම්‍ය සැපයුම් නම්‍යතාවයි.




මෙහි දී සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය අපරිමිත වේ. සැපයුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර සරල රේඛාවක් සේ පිහිටයි
පිහිටයි.

භාණ්ඩයක සැපයුම් මිල නම්‍යතාව තීරණය කරන සාධක

1. සාධක සංචලන හැකියාව

එක් නිෂ්පාදන කාර්යයක සිට වෙනත් නිෂ්පාදන කාර්යයක් සඳහා සම්පත් මාරුවීම සාධක සංචලනය යන්නෙන් අදහස් වේ. කිසියම් භාණ්ඩයක මිල වැඩි වන විට එම භාණ්ඩයේ සැපයුම කෙටි කාලයක් තුළ වැඩි කළ හැක්කේ එම භාණ්ඩය සඳහා අවශ්‍ය කරන යෙදවුම් වෙනත් නිෂ්පාදනවලින් ලබාගැනීමෙනි.

එලෙසින් එක් නිෂ්පාදන කාර්යයක සිට තවත් නිෂ්පාදන කාර්යයක් සඳහා සම්පත් පහසුවෙන් මාරු කිරීමට හැකි වන විට භාණ්ඩයේ මිල වැඩි වන විට සැපයුම් ද කෙටි කාලයක් තුළ වැඩි වේ. මේ අනුව සාධක සංචලන හැකියාව වැඩි වන විට පවතින්නේ නම්‍ය සැපයුම් තත්ත්වයකි.එහෙත් සාධක සංචලන හැකියාව දුෂ්කර වන විට එම භාණ්ඩ සඳහා ඇත්තේ අනම්‍ය සැපයුම් තත්ත්වයකි.

2. භාණ්ඩයේ ස්වභාවය

සලකා බලන භාණ්ඩය නිෂ්පාදනය කිරීමට යොදා ගනු ලබන නිෂ්පාදන සම්පත් වෙනත් භාණ්ඩ නිපදවීම සඳහා ආදේශ කිරීමේ හැකියාව භාණ්ඩයේ ස්වභාවය යන්නෙන් අදහස් වේ.

කිසියම් භාණ්ඩයක් නිපදවීම සඳහා භාවිත කරන නිෂ්පාදන සාධයක් වෙනත් නිෂ්පාදන සාධයකයක් වෙනත් නිෂ්පාදන කාර්යයක් සඳහා ආදේශ කිරීමේ හැකියාව වැඩි නම් එම භාණ්ඩයේ සැපයුම නම්‍ය වේ.

3. තොග පවත්වා ගෙන යෑමේ හැකියාව

යම් භාණ්ඩයක තොග පවති ද නැද්ද යන්නත් එම භාණ්ඩයේ සැපයුම් නම්‍යතාව කෙරෙහි බලපායි. තොග පවත්වා ගෙන යෑමේ හැකියාව වැඩි නම් එම භාණ්ඩ සඳහා නම්‍ය සැපයුමක් පවතී. එහෙත් තොග පවත්වා ගෙන යෑම දුෂ්කර ව පවතින භාණ්ඩ සඳහා ඇත්තේ අනම්‍ය සැපයුම් තත්ත්වයකි.

4. මිල වෙනස් වීම හේතුවෙන් සැපයුම් වෙනස් කිරීමට ගත වන කාලය

මිල වෙනස් වීමෙන් පසු ගත වී ඇති කාලය විශාල නම් එවැනි භාණ්ඩ සඳහා ඇත්තේ නම්‍ය සැපයුමකි. ඊට හේතුව අදාළ කාලය විශාල වත් ම සාධක සංචලනය වීමට ඉඩකඩ වැඩි විම යි.

එහෙත් මිල වෙනස් වීමෙන් පසු ගත වී ඇති කාලය කෙටි නම් එවැනි භාණ්ඩ සඳහා ඇත්තේ අනම්‍ය සැපයුමකි. අදාළ කාලය කෙටි නිසා සාධක සංචලනය වීමට ඇති ඉඩකඩ අඩු විම එයට හේතුව යි.

- සැපයුම් මිල නම්‍යතා සංකල්පය ආර්ථික විශ්ලේෂණය සඳහා ඉතා වැදගත් වේ.

විවිධ පිරිස්වලට ප්‍රායෝගික වශයෙන් සැපයුම් නම්‍යතා සංකල්පය වැදගත් වන අවස්ථා කිහිපයකි.

- භාණ්ඩයක මිල වෙනස් වන විට පාර්භෝගික පැහැදම / නිෂ්පාදනක අයභාරයට කෙරෙන බලපෑම පුරෝකථනය කළ හැකි වීම.
- තම නිෂ්පාදන සඳහා ආදායම උපරිම කෙරෙන ආකාරයට මිලක් තීරණය කළ හැකි වීම.
- ව්‍යාපාර ආයතනයකට ඇති ඒකාධිකාරී ශක්තිය නිශ්චය කළ හැකි වීම.
- යම් භාණ්ඩයක් සඳහා පවතින ආදේශක හා අනුපූරක භාණ්ඩ කවරේ ද යන්න හඳුනා ගැනීම
- සාධක සංචලන හැකියාව හඳුනා ගත හැකි වීම.

# ආදර්ශ ප්‍රශ්න

(01) භාණ්ඩයේ මිල හා ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවයක් දැකිය හැක්කේ මින් කුමන භාණ්ඩයක් සඳහා ද?

(1) බාල භාණ්ඩ (2) ගිෆන් භාණ්ඩ (3) සාමාන්‍ය භාණ්ඩ

(4) ආදේශන භාණ්ඩ (5) අනුපූරක භාණ්ඩ (......)

(02) භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයක් දැකිය හැක්කේ කවර සාධකය මඟින් ද?

(1) අන් භාණ්ඩවල මිල ගණන් වැඩිවීම.

(2) අනාගතයේ භාණ්ඩයේ මිල වැඩිවේ යැයි අපේක්ෂා කිරීම.

(3) නිෂ්පාදන සාධක මිල ගණන් වෙනස් වීම.

(4) සැපයුම්කරුවන්ගේ ලාභය අඩු වැඩි වීම.

(5) තාක්ෂණික ශිල්පීය ඥාණය. (......)

(03) රජය මඟින් පනවන ලද දේශීය බද්දක් සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට දැරීමට සිදුවන්නේ එම භාණ්ඩයේ,

(1) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට අඩු අගයකදී ය.

(2) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි අගයකදී ය.

(3) මිල ඉල්ලුම් නම්‍යතාවය ඒකීය අගයකදී ය.

(4) මිල ඉල්ලුම් නම්‍යතාවය අපරිමිත අගයකදී ය.

(5) මිල ඉල්ලුම් නම්‍යතාවය පූර්ණ අනම්‍ය අගයකදී ය . (......)

(04) වෙළඳපලේ මත්පැන් සඳහා අනම්‍ය ඉල්ලුමක් පවතින විට රජය බද්දක් පැනවීමෙන් පසු ඉහළ ගියේ නම්,

(1) ව්‍යාපාරික අයභාරය ඉහළ යයි. (2) ව්‍යාපාරික අයභාරය පහළ යයි.

(3) පාරිභෝගික පැහැදීම පහළ යයි. (4) රජයේ අයභාරය පහළ යයි.

(5) ව්‍යාපාරික අයභාරයේ වෙනසක් නොවේ. (......)

(05) භාණ්ඩයේ මිල සාමාන්‍ය අයභාරයට හා ආන්තික අයභාරයට සමාන වන්නේ,

(1) පූර්ණතරගකාරී වෙළඳපලක (2) ඒකාධිකාරී වෙළඳපලක

(3) ඒකාධිකාරී තරග වෙළඳපලක (4) කෘතිර්‍යාධිකාරී වෙළඳපලක

(5) භාණ්ඩ හා සේවා වෙළඳපලක (......)

(06) සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් නම් පාරිභෝගිකයාගේ ආදායම අඩුවෙත්ම දූනට වෙළඳපලේ

තීරණය වී ඇති සමතුලිත මිලට හා ප්‍රමාණයට කුමක් සිදු විය හැකිද?

(1) සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය ද වැඩිවේ.

(2) සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය ද පහළ යයි.

(3) සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය අඩුවේ.

(4) සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය වැඩිවේ.

(07) සමතුලිත මිල හා ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ. (......)

(08) එක්තරා වෙළඳපලක X භාණ්ඩයේ ඉල්ලුම $Qd - 140 - 2P$ හා සැපුයම $Qs = 60 + 3P$ වේ. රජය මෙම භාණ්ඩය අළෙවිකළ හැකි උපරිම මිල ලෙස රු. 20/= ප්‍රකාශයට පත්කිරීමෙන් පසු වෙළඳපලේ X භාණ්ඩය සම්බන්ධයෙන්,

(1) භාණ්ඩ ඒකක 60 ක අධි ඉල්ලුමක් ඇතිවේ.

(2) භාණ්ඩ ඒකක 160 ක අධි ඉල්ලුමක් ඇතිවේ.

(3) භාණ්ඩ ඒකක 60 ක අධි සැපයුමක් ඇතිවේ.

(4) භාණ්ඩ ඒකක 100 ක අධි සැපයුමක් හට ගනී.

(5) භාණ්ඩ ඒකක 160 ක අධි ඉල්ලුමක් හටගනී. (......)

(08) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි පාරිභෝගික භාණ්යක් සඳහා රජය විසින් සහනාධාරයක් ලබාදෙන ලදී. එහි වාසිය අත්පත්වන්නේ,

(1) සම්පූර්ණයෙන්ම නිෂ්පදකයාට.

(2) සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට.

(3) නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට සමානව.

(4) නිෂ්පාදකයාට වඩා වැඩි වාසියක් පාරිභෝගිකයාට.

(5) පාරිභෝගිකයාට වඩා වැඩි වාසියක් නිෂ්පදකයාට. (......)

(09) වෙළඳල ආර්ථිකයක දැකිය හැකි ප්‍රධානතම ලක්ෂණයකි,

(1) සම්පත්වල අයිතිය රාජ්‍ය සතුවීම.

(2) සම්පත්වල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික අංශය සතුවීම.

(3) මූලික ආර්ථික ප්‍රශ්න මධ්‍යගත සැලසුම් යාන්ත්‍රණය මගින් විසඳීම.

(4) රජයේ කාර්ය භාරය අසීමිත වීම.

(5) මිල යාන්ත්‍රණය මගින් ආර්ථිකය මෙහෙයවීම. (......)

(10) වෙළඳපල ආර්ථිකයක ''ලාභය'' මඟින් සිදුකරන කාර්යයක් වන්නේ මින් කුමක් ද?

(1) වෙළඳපලට සංඥා සැපයීම.

(2) යටිතල පහසුකම් සැපයීමට මඟ පෙන්වීම.

(3) ශුභ සාධන භාණ්ඩ නිෂ්පාදනයට අභිප්‍රේරණය සැපයීම.

(4) පොදු භාණ්ඩ සැපයීමට සම්පත් බෙදා වෙන් කිරීම.

(5) ඉහත සඳහන් සියල්ලම. (......)